www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

4891

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-.............................................................. විභාග අංකයː-..............................................

අයදුම්කරුවන්ට උපදෙස්
- I කොටසේ සියළු ම ප්‍රශ්නවලට ද II කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 2 ක් ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

## I කොටස

- පහත දැක්වෙන කවි, ගී පද ආශ්‍රයෙන් 1 - 4 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. කැමට බොහොම පලතුරු ඇත තැනින්     තැන
සැපකට නිතර හිතවෙයි ඒ රස     බොජුන

ii. වෙදා නටන්නේ පළමුව සබයට     එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත     වෙවුලන්නේ

iii. මව්පියො නිදහස් වෙන්නටා
මාව දුන්නයි නාකි වූ හමෙකුටා

iv. ඉඳින් බබෝ ඉඳින්    - මගේ අතේ ඉඳින්
බොහෝ ආදරෙන් තුඹේ මවමෙන්    - රකිනෙමි මෙමං

01. නාඩගම් ගීතයක් වන්නේ,
1. i    2. ii    3. iii    4. iv

02. කෝලම් ගීතයකට අයත් වන්නේ,
1. i    2. ii    3. iii    4. iv

03. සොකරි ගැමි නාට්‍යයකට අයත් ගීතයක් වන්නේ
1. i    2. ii    3. iii    4. iv

04. සිරිත් මල්දමේ එන කවි දෙපදයක් වන්නේ,
1. i    2. ii    3. iii    4. iv

05. නාට්‍ය සංගීතය හා නාට්‍ය ගීත අයත් වන්නේ පිළිවෙලින් කුමන අභිනයට ද?
1. වාචික අභිනයට හා ආහාර්ය අභිනයට    2. ආහාර්ය අභිනයට හා ආංගික අභිනයට
3. ආහාර්ය අභිනයට හා වාචික අභිනයට    4. ආංගික අභිනයට හා වාචික අභිනයට



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

06. ආනුෂංගික අංග යනු,

1. නාට්‍ය සංගීතයටයි.
2. ඇඳුම් පැළඳුම් හා අංග රචනයයි.
3. වේදිකා පසුතල නිර්මාණයයි.
4. මේ සියලු අංගවල එකතුවයි.

07. වේදිකා පසුතල නිර්මාණ සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.

1. නාට්‍යයේ රංග ශෛලියට ගැළපෙන ලෙස සකස් විය යුතුයි.
2. අවස්ථාවට උචිත අයුරින් සකස් විය යුතුයි.
3. එක නාට්‍යයක් සඳහා යොදාගත් පසු තවත් නාට්‍යයක් සඳහා යොදා ගත හැකි අන්දමින් ශක්තිමත්ව සකස් විය යුතුයි.
4. අලංකාරව මෙන්ම සරලව සකස් විය යුතුයි.

08. නළුවරණය යනු,

1. නාට්‍ය පෙළට අදාළ චරිත තෝරා ගැනීමයි.
2. එක් එක් චරිතවල වෙනස හඳුනා ගැනීමයි.
3. චරිතවලට ගැළපෙන නළුවන් තෝරා ගැනීමයි.
4. නළුවන්ට කැමති චරිතය තෝරා ගැනීමට අවස්ථාව සලසා දීමයි.

09. අභිරූපණයේදී භාවිත නොකරන අභිනය නම්

1. ආංගික අභිනයයි.
2. වාචික අභිනයයි.
3. සාත්වික අභිනයයි.
4. ආහාර්ය අභිනයයි.

10. පහසුවෙන් සිටගෙන හොඳින් හුස්ම ගෙන උදරය පුරවා ස්වල්ප වේලාවක් රඳවා තබාගෙන ක්‍රමයෙන් මුවින් ''ආ'' ''ඕ'' ''ලා'' වැනි හඬ නිකුත් කරමින් හුස්ම පිටකරමින් කරනු ලබන අභ්‍යාසය

1. රංග ක්‍රීඩාවකි.
2. ශිථිලකරණ අභ්‍යාසයකි.
3. කටහඬ පුහුණු අභ්‍යාසයකි.
4. චිත්ත ඒකාග්‍රතාව ඇති කරන අභ්‍යාසයකි.

11. සිසුන් දෙදෙනා බැගින් ගෙන එක් අයෙක් රුකඩයක් ලෙස ලනුවකින් හිස මුදුනින් ගැටගසා ලනුව උස් ස්ථානයක රඳවා ලනුවෙන් අනික් අය අදින විට, රූකඩය කෙලින් වී එන අන්දමින් ලනුව බුරුල් කරන විට, රූකඩය ලෙස සිටින සිසුවා බිම වැටෙන අයුරු පෙන්නුම් කරන ක්‍රියාකාරකම අයත් වන්නේ කුමන අභ්‍යාස කාණ්ඩයට ද?

1. සංවේදන අභ්‍යාස
2. තාපන අභ්‍යාස
3. ශිථිලකරණ අභ්‍යාස
4. රංග ක්‍රීඩා

12. හඬ අභ්‍යාස පුහුණු කිරීම සඳහා වඩාත්ම උපයෝගී කරගත හැකි ග්‍රන්ථයකි.

1. බුද්ධ ගජ්ජය
2. සිරිත්මල්දම
3. නාට්‍ය ශාස්ත්‍රය
4. කාව්‍ය ශාස්ත්‍රය

13. ආගමික නාට්‍ය ප්‍රදර්ශනය කිරීමේ අරමුණු අතරට නොගැනිය හැකි කරුණ කුමක් ද?

1. විනෝදාස්වාදය
2. සමාජ සංවර්ධනය
3. පොදු ජනතාව ඒ සඳහා ඒකරාශී කරගැනීම
4. නාට්‍ය නිර්මාණය පිළිබඳ අවබෝධයක් ලබාදීම

• <u>14 - 16 දක්වා ප්‍රශ්නවල දී ඇති වචනවලින් නිවැරදි වචනය යොදා වාක්‍ය නිවැරදිව සම්පූර්ණ කරන්න.</u>

14. නිශ්චිත ගණිත ක්‍රමයකට අනුව බෙදා වෙන්කළ චලන හඳුන්වන්නේ ............... වශයෙනි.

1. ස්වභාවික චලන
2. නිර්මිත චලන
3. තාලානුකූල චලන
4. අංග චලන



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

15. නාට්‍ය පෙළකින් කියවෙන ප්‍රධාන අදහස හැඳින්වෙන්නේ ................ වශයෙනි.
1. පණිවුඩය 2. තේමාව 3. කථා සාරාංශය 4. ගැටුම

16. නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්නා හඳුන්වන්නේ ................ වශයෙනි.
1. අධ්‍යක්ෂවරයා 2. නිෂ්පාදකවරයා 3. ලේඛකයා 4. පෙළ රචකයා

- **පහත සඳහන් ප්‍රකාශයන් කියවා හොඳින් අවබෝධ කරගෙන 17 - 20 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි ප්‍රකාශය (පිළිතුර) තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත යොදන්න.**

i. නාට්‍ය නිෂ්පාදක හෝ පෙළ රචක යන පද දෙකෙන්ම හඳුන්වන්නේ එක් අයෙකි.
ii. අංග රචනය හෝ වේෂභූෂණය යනු එකම ක්‍රියාවකි.
iii. නාට්‍ය නිෂ්පාදන හෝ අධ්‍යක්ෂ යන පද දෙකෙන්ම අදහස් කරන්නේ එක් අයෙකි.
iv. නාට්‍ය නිෂ්පාදක යනු නාට්‍ය සඳහා මුදල් වියපැහැදම් කරන්නාය.

17. ඉහත ප්‍රකාශ හතරෙන් වඩාත්ම නිවැරදි විය හැකි බවට එකඟ විය හැකි ප්‍රකාශය කුමක් ද? (............)
18. ඉහත ප්‍රකාශ අතරින් වඩාත්ම වැරදි ලෙසට එකඟ විය හැකි කරුණ කුමක් ද? (............)
19. ඉහත ප්‍රකාශ අතරින් ඇතැම් අවස්ථාවලදී එකඟ විය හැකි කරුණ කුමක්ද? (............)
20. වෙනත් චරිතයකට ආරෝපනය වීමට හැකිවන කරුණ කුමක් ද? (............)

(ලකුණු 20x1=20)

## II කොටස

- පළමු ප්‍රශ්නය සමග තවත් ප්‍රශ්න දෙකක් තෝරා ගෙන ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

1. "මේ ගෙදර කවුරු හරි ඉන්නවා හරිම පිළිවෙලයි. කෑම මේසයක්, නිදා ගන්න ඇඳක්, ලස්සන මල් පෝච්චියක් කෑම මේසය උඩ..."
 i. ඉහත සංවාද කොටස අයත් නාට්‍ය නම් කරන්න. (ලකුණු 02)
 ii. එය නිර්මාණය කරන ලද රචකයා නම් කරන්න. (ලකුණු 02)
 iii. මේ සංවාද කොටස කියන්නේ කවු ද? (ලකුණු 02)
 iv. මේ ගෙදර කාගේ ගෙයක් ද? (ලකුණු 01)
 v. කෑම මේසය මත තිබුණේ කුමක් ද? (ලකුණු 01)
 vi. මේ නාට්‍යයේ ප්‍රධාන චරිතය තුළ ප්‍රබලව මතු වී පෙනෙන දුර්වල චරිත ලක්ෂණයක් හා ප්‍රබල චරිත ලක්ෂණයක් ලියන්න. (ලකුණු 02)

2. 1. නාට්‍ය පිටපතක් රචනා කිරීම සඳහා උපයෝගි කරගත හැකි මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)
 2. නාට්‍ය පිටපත රචනා කිරීම සඳහා සැලකිල්ලට ගත යුතු ශෛලීන් දෙක කුමක් ද? (ලකුණු 03)
 3. නාට්‍යයකට සුදුසු කථාවක හෝ සිදුවීමක තිබිය යුතු ලක්ෂණ, කරුණු 5 ක් පමණ ඇතුළත් වන පරිදි විස්තර කරන්න. (ලකුණු 05)

3. 1. ආනුෂංගික අංග යනු කුමක් ද? (ලකුණු 02)
 2. ආනුෂංගික ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)
 3. ඔබ සඳහන් කරන ලද එක් ආනුෂංගික ශිල්පියකුගේ කාර්යභාරය ගැන විස්තර කරන්න. (ලකුණු 05)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

4. 1. අභිරූපණය යනු කුමක් ද? (ලකුණු 02)
   2. අභිරූපණයේදී මූලික වන අභිනයන් දෙක කුමක් ද? (ලකුණු 03)
   3. අභිරූපණ රංගන ශිල්පියෙකු තුළ පැවතිය යුතු ගුණාංග මොනවා ද? (ලකුණු 05)

5. 1. ශිථිලකරණ අභ්‍යාස යනු කුමක් ද? (ලකුණු 02)
   2. ශිථිලකරණ අභ්‍යාසවලින් අත්වන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)
   3. ශිථිලකරණ අභ්‍යාසයක් සිදුකරන ආකාරය ලියන්න. (ලකුණු 05)

06. ඔබ දන්නා ජන කථාවක් තෝරාගෙන නාට්‍ය පිටපතක් රචනා කරන්න. (ලකුණු 10)

| | |
|---|---|
| I කොටස ලකුණු | - 20 |
| II කොටස ලකුණු | - 30 |
| මුළු ලකුණු | - 50 |

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk